**ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය - 2013**

---

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (1) වගන්තිය සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාර සංස්ථාවේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810 ) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කිරීම පිණිස මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් මණ්ඩලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

---

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

# 2. මූල්‍ය ප්‍රකාශන

---

## 2.1 තත්ත්වාගණනය කළ මතය

---

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

---

### 2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (ශ්‍රී.ලං. ගි.ප්‍ර)

---

ශ්‍රී.ලං.ගි.ප්‍ර 2- තොග: වටිනාකම රු.මිලියන 51.67 ක් වූ 2013 දෙසැම්බර් 31 දිනට වැඩබිම්වල තිබුණු තොග අයිතමයන්, එම තොගවල අයිතමය අනුව හෝ ඒවායේ ස්වභාවය අනුව වර්ගීකරණය නොකර ගබඩා කර තිබුණු ස්ථානය අනුව වර්ගීකරණය කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) එකතුව රු.මිලියන 458.89 ක්වූ මෝටර් රථ අමතර කොටස්, ජල පොම්ප සහ පොම්ප අමතර කොටස් වලට අදාළ තොග, දේපල, පිරියත හා උපකරණ (දේ.පි.උ) ප්‍රාග්ධනීත කිරීමේ නිර්ණායකයන් පිළිබඳ නොසලකා ප්‍රාග්ධනිත කර තිබුණි. මෙම නිසා මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු දේපළ, පිරියත හා උපකරණ එම වටිනාකමින් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

තවද සමාලෝචිත වර්ෂය තුල ප්‍රාග්ධනිත කරන ලද පොම්ප, නල හා අමතර කොටස් රු.මිලියන 690.88 ක් වූ නමුත් 2013 දෙසැම්බර් 31 දිනට භෞතික සත්‍යාපන ශේෂය රු.මිලියන 707.56 ක් විය. එබැවින් 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ දේපල පිරියත හා උපකරණ රු. මිලියන 16.68 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු ශුද්ධ වටිනාකම රු.මිලියන 107,314.69 ක්වූ දේපල, පිරියත හා උපකරණ සම්බන්ධව පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) තොග යටතේ තිබුණු රු.මිලියන 24.24 ක්වූ ජංගම නොවන වත්කම් ගිණුම් වලට ඇතුලත් කර නොතිබීම හේතුවෙන් දේපල, පිරියත හා උපකරණවල සහ තොගවල අගය එම වටිනාකමින් පිළිවෙලින් අඩුවෙන් හා වැඩියෙන් දක්වා තිබුණි. එසේම, 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු ක්ෂය වටිනාකමද රු.මිලියන 1.07 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ii) වටිනාකම රු.මිලියන 48.27 ක වත්කම් අඹතලේ ජල පවිත්‍රාගාරය සඳහා වර්ෂ 10 ක කල්බදු පදනම මත පෞද්ගලික සමාගමකින් 2002 වර්ෂය තුලදී ලබාගෙන තිබුණු

අතර අදාල බදු කාලය 2012 සැප්තැම්බර් 30 දින අවසන් වීමට නියමිතව තිබුණද මෙම වත්කම් මණ්ඩලයේ වත්කම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(iii) නැගෙනහිර ප්‍රාදේශීය සහායක මධ්‍යස්ථානයට අයත් ජංගම නොවන වත්කම් අයිතම් 77 ක වටිනාකම ගණනය කර ගිණුම්ගත කර නොතිබුණි.

(iv) එකතුව රු.මිලියන 13.68 ක ජංගම නොවන වත්කම් දෙවරක් දේපල, පිරියත හා උපකරණ යටතේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා රු.228,508 ක් ක්ෂය කර තිබීම නිසා 2013 දෙසැම්බර් 31 දිනට දේපල, පිරියත හා උපකරණ වැඩියෙන්ද වර්ෂයේ ලාභය අඩුවෙන්ද දක්වා තිබුණි.

(v) දකුණු ප්‍රාදේශීය සහායක මධ්‍යස්ථානයට අයත් වටිනාකම රු.මිලියන 499.29 ක් වූ මෝටර් රථ, ගොඩනැගිලි සහ අනෙකුත් ජංගම නොවන වත්කම් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවලට ඇතුලත් කර ක්ෂය කර නොතිබීම නිසා, සමාලෝචිත වර්ෂයේ ලාභය රු.මිලියන 22.89 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(vi) විදේශ ප්‍රදානයන් යටතේ කැලණිය ප්‍රාදේශීය කාර්යාලය මඟින් මිලටගෙන තිබුණු වටිනාකම රු.මිලියන 39 ක්වූ මෝටර් රථ ප්‍රාග්ධනිත කර තිබුණද, ප්‍රදානයට අදාල රු.මිලියන 1.95 ක් වූ ක්‍රමක්ෂය මූල්‍ය ප්‍රකාශනවල ගලපා නොතිබුණි.

(vii) යටියන්තොට ජල සැපයුම් යෝජනා ක්‍රමයේ කෙරීගෙන යන වැඩවල ඇතුලත් රු.මිලියන 2.64 ක්වූ ඉඩමෙහි වටිනාකම රු.මිලියන 26.4 ක් ලෙස වැරදි ආකාරයට දේපල, පිරියත හා උපකරණ ගිණුමට 2012 වර්ෂයේදී මාරුකර තිබුණි. සමාලෝචිත වර්ෂයේදීද මෙම වරද නිවැරදි නොකිරීම නිසා, දේපල, පිරියත හා උපකරණ සහ කෙරීගෙන යන වැඩ වටිනාකම පිළිවෙලින් රු.මිලියන 23.76 ක් වැඩියෙන් හා අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඇ) මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු ශුද්ධ අගය රු.මිලියන 3,800.86 ක තොග සම්බන්ධව පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) වැරදි ගණනය කිරීම් හේතුවෙන් හානිවූ තොග සඳහා සිදුකර තිබුණු ප්‍රතිපාදනය රු.මිලියන 2.81 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ii) කළුතර ප්‍රාදේශීය කාර්යාලයට ශ්‍රී ලංකා සුනාමි ආංශික ප්‍රදේශ ප්‍රතිෂ්ඨාපනය කිරීමේ හා ඉවත් කිරීමේ ව්‍යාපෘතියෙන් (START) ලැබී තිබුණු වටිනාකම රු.මිලියන 4.23 ක තොගවල අගය ගිණුම්වලට ඇතුලත් කර නොතිබුණි. එසේම උප ජල (Biwater) ව්‍යාපෘතියෙන් මීගමුව නිෂ්පාදන මධ්‍යස්ථානයට ලැබී තිබුණු තොග අයිතම 8,246 ක්ද ගිණුම්වලට ඇතුලත් කර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ ස්ථාවර වත්කම් සහ කෙරීගෙන යන වැඩවල තථ්‍ය මූල්‍ය විචලනය ගණනය කිරීමෙන් තොරව, එම ගිණුම්වල ආරම්භක හා අවසාන ශේෂයන්වල වෙනස වූ රු.මිලියන 21,595 ක ප්‍රමාණය සමාලෝචිත වර්ෂයේ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයෙහි මුදල් ගලායාමක් ලෙස දක්වා තිබුණි. අවශ්‍ය ලේඛන නඩත්තු කර නොතිබීම නිසා සමාලෝචිත වර්ෂයේදී වැයකළ තථ්‍ය මුදල් ප්‍රමාණය විගණනයේදී ගණනය කළ නොහැකි විය.

(ඉ) මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු රු.මිලියන 121,425.42 ක කෙරීගෙන යන වැඩ ශේෂය සම්බන්ධව පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) පිරිවැය රු.මිලියන 4,460 ක්වූ නිම කරන ලද හා ක්‍රියාත්මක කරන ලද ජල සැපයුම් ව්‍යාපෘති 144 ක අගය 2013 දෙසැම්බර් 31 දිනට ප්‍රාග්ධනිත කිරීමකින් තොරව කෙරීගෙන යන වැඩ ලෙස දක්වා තිබුණි. මෙයින් පිරිවැය රු.මිලියන 122.64 ක්වූ ව්‍යාපෘති නවයක් වර්ෂ හතරකට පෙර නිමකර තිබුණි.

(ii) ඉහත දක්වා තිබුණු කෙරීගෙන යන වැඩ ශේෂයට අසාමාන්‍ය සෘණ ශේෂයන් ඇතුලත් කර තිබීම නිසා එම අගය රු.මිලියන 20.87 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(iii) එකතුව රු.මිලියන 1,007.14 ක ශේෂයන් විමර්ශනය කර අවශ්‍ය ගැලපීම් කිරීමකින් තොරව වර්ෂ 03 සිට 07 දක්වා කාලයක සිට මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(iv) රු.මිලියන 129.1 ක මුදලකට මණ්ඩලය ලබාගත් බාහිර ව්‍යාපෘති දෙකක් අවසන්කර අදාල පාර්ශව වෙත 2013 දෙසැම්බර් 31 දින වනවිට භාරදී තිබුණද එම ව්‍යාපෘති කෙරීගෙන යන වැඩ ශේෂයෙහි දක්වා තිබුණි.

(v) වැඩ අවසන් කර සහ ප්‍රාග්ධනිත කළ පිරිවැය රු.මිලියන 87.67 ක්වූ ව්‍යාපෘති තුනකට අදාල ඇතැම් වියදම් අදාල වත්කම් ගිණුම් වලට මාරු කිරීමකින් තොරව කෙරීගෙන යන වැඩ ගිණුමෙහි දක්වා තිබුණි.

(vi) වැටුප් ප්‍රතිපූර්ණය කිරීම් දෙවරක් මණ්ඩලයේ ගිණුම් වලට ඇතුලත් කිරීම සහ පොදුකාර්ය පිරිවැය අත්හැර තිබීම යන කරුණු හේතුවෙන් මහ කොළඹ පුනරුත්ථාපන ව්‍යාපෘතියේ කෙරීගෙන යන වැඩ ශේෂය රු.මිලියන 2.02 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(vii) කෙරීගෙන යන වැඩවලට අදාල නොවන රු.999,511 ක වියදම් කළුතර ප්‍රාදේශීය සහායක මධ්‍යස්ථානයට ඇතුලත් කර තිබුණි.

(ඊ) ගෙවිය යුතු ණය පොළී යටතේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු රු.මිලියන 2,431.66 සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) ආදායම් නොලබන ජලය සඳහා වූ ඉංජිනේරුමය අධ්‍යයන/ප්‍රධාන සැලසුම් ව්‍යාපෘතියේ උපදේශක සේවාවන් සඳහා 2011 හා 2012 වර්ෂ සහ 2013 පළමු අර්ධ වර්ෂ වලදී ලබාගත් ණය වෙනුවෙන් ගෙවිය යුතු ණය පොලී පිළිවෙලින් රු.මිලියන 2.2 ක් හා රු.මිලියන 2.48 ක් ගිණුම්වලට ඇතුලත් කර නොතිබුණි.

(ii) අම්පාර දිස්ත්‍රික්කයේ සේවා සපයා නොමැති ප්‍රදේශ සඳහා වූ ඒකාබද්ධ ජල සැපයුම් යෝජනා ක්‍රමයේ III අදියරෙහි 2010 සහ 2012 වර්ෂවලට අදාල එකතුව රු.මිලියන 77.24 ක් වූ පොලිය ගිණුම්ගත කර නොතිබුණි. එසේම, සමාලෝචිත වර්ෂයේ දෙවන අර්ධ වර්ෂය සඳහා වූ පොලියද ගණනය කර නොතිබුණි.

(iii) මොරටුව, පානදුර හා මීගමුව ප්‍රදේශවල පානීය ජල පිරිපහදු පහසුකම් සැපයීමේ ව්‍යාපෘතිය නිර්මාණය කිරීමේ සහ ඉදිකිරීමේ කටයුතු වෙනුවෙන් ස්පාඤ්ඤ සුනාමි සහන අරමුදලින් ලැබුනු 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු රු.මිලියන 34.14 ණය ශේෂය මණ්ඩලයට ලබා දී තිබූ ප්‍රදානයක්ද ණය මුදලක්ද යන්න හඳුනා ගැනීමට නොහැකි වීම නිසා සමාලෝචිත වර්ෂයට අදාල පොලිය ගණනය කර ගිණුම්වලට ඇතුලත් කර නොතිබුණි.

" ගෙවිය යුතු ණය මුදල හා පොලිය 2014 දෙසැම්බර් 31 දිනට ජාතික ජල සම්පාදන හා ජලපවහන මණ්ඩලයේ ස්කන්ධයට එකතු කිරීමට මහා භාණ්ඩාගාරය අනුමත කර ඇති බවත්, ගෙවිය යුතු ණය සහ පොලිය මාරු කිරීමට අදාල ගිණුම් සටහන 2015 වර්ෂය තුළ සිදුකරන බවත් " මේ සම්බන්ධයෙන් මණ්ඩලයේ සභාපතිවරයා විසින් දන්වා තිබුණි.

(උ) ආසියානු සංවර්ධන බැංකුව විසින් මුල්‍යායනය කරන ලද යාපනය කිලිනොච්චි ජල සැපයුම් ව්‍යාපෘතිය සඳහා මහා භාණ්ඩාගාරය ලබාදී තිබුණු රු.මිලියන 88.12 ක උප ණය මුදල සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවලට ඇතුලත් කර නොතිබුණි. එසේම, ව්‍යාපෘතියේ රු.මිලියන 88.12 ක්වූ කෙරීගෙන යන වැඩ ශේෂයද ගිණුමවලින් අත්හැර තිබුණි.

(ඌ) විසල් ත්‍රිකුණාමලය ජලසම්පාදන ව්‍යාපෘතිය සඳහා ප්‍රංශ රජය සහ ප්‍රංශයේ සංවර්ධන නියෝජිතායතනය මගින් 2009 වර්ෂයේදී රු.මිලියන 133.72 ක් ප්‍රදානය කර තිබුණි. මෙම මුදලින් භාගයක් ප්‍රදානයක් ලෙසද ඉතිරි ශේෂය උප-ණයක් ලෙස ද මහා භාණ්ඩාගාරය සලකා තිබුණි. එසේ වුවත්, සම්පූර්ණ මුදලම ණය මුදලක් ලෙස මණ්ඩලය විසින් ගිණුම්ගත කර තිබුණු අතර එම දෝෂය 2012 වර්ෂයේදීද දක්නට තිබුණි. නමුත් සමස්ථ මුදලට හා කාලපරිච්ඡේදයට අදාළ පොලිය 2013 වර්ෂයේදී ගිණුම්ගත කර නොතිබුණු අතර මෙහි ප්‍රතිඵලයක් ලෙස සමාලෝචිත වර්ෂයේ ශුද්ධ ලාභය සහ 2013 ජනවාරි 01 දිනට ඉදිරියට ගෙන ආ ලාභ ශේෂය පිළිවෙලින් රු.මිලියන 4.01 කින් සහ රු.මිලියන 12.03 කින් අඩුවෙන් දැක්විණි. එසේම 2013 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ශේෂය රු.මිලියන 16.05 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(එ) 2013 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව, 2013 දෙසැම්බර් 31 දිනට විදේශ ප්‍රදාන ගිණුමේ ශේෂය රු.මිලියන 128,841.23 ක් වූ අතර මේ සම්බන්ධව පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(i) 2010 සහ 2012 වර්ෂවලදී ගෙවන ලද එකතුව රු.මිලියන 5.94 ක් වූ සේවක පාරිතෝෂිත මුදල් පාරිතෝෂිත අරමුදල් ප්‍රතිපාදන ගිණුමට හර නොකර ප්‍රදාන ගිණුමට හරකර තිබුණි. මෙම නිසා 2013 දෙසැම්බර් 31 දිනට වූ මූල්‍ය ප්‍රකාශනවල සේවක පාරිතෝෂිත අරමුදල් වෙන් කිරීමේ ගිණුමේ ශේෂය සහ ප්‍රදාන ගිණුමේ ශේෂය එම ප්‍රමාණයෙන් වැඩියෙන් සහ අඩුවෙන් දක්වා තිබුණි.

(ii) යාපනය හා කිලිනොච්චි ජල සම්පාදන ව්‍යාපෘතියට සහ ප්‍රජාමූල ග්‍රාමීය ජලසම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතිය වැඩිදියුණු කිරීම සඳහා ලැබුණු විදේශ ප්‍රදාන පිළිවෙලින් රු.මිලියන 339.4 ක් හා රු.මිලියන 49.21 ක් සහ අදාළ කෙරීගෙන යන වැඩ මණ්ඩලයේ ගිණුම්වලට ඇතුළත් කර නොතිබුණි.

(ඒ) ණය පදනම මත ලබාදී තිබුණු නව ජල සැපයුම් සම්බන්ධතා ණයගැතියන් ලෙස ගිණුම්වලට ඇතුලත් කර නොතිබුණි. නමුත්, ජල පාරිභෝගිකයන් විසින් මාසිකව ගෙවා තිබුණු වාරික නව ජල සැපයුම් සම්බන්ධතා ණයගැති පාලන ගිණුමට බැරකර තිබුණි. මෙහි ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු නව ජල සැපයුම් සම්බන්ධතා ණයගැති පාලන ගිණුමේ රු.මිලියන 17.31 ක බැර ශේෂයක් පෙන්නුම් කෙරුණි. මෙම අඩුපාඩුව හේතුවෙන් නව ජලසැපයුම් සම්බන්ධතා වලින් ලද ආදායම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඔ) වගකීම් හා ආදායම් ගිණුම්වල එකතුව රු.මිලියන 27.06 ක හර ශේෂයක් සහ වත්කම් හා වියදම් ගිණුම්වල එකතුව රු.මිලියන 122.45 ක බැර ශේෂයක් අසාමාන්‍ය ලෙස පෙන්නුම් කිරීම නිසා සමාලෝචිත වර්ෂයේ මණ්ඩලයේ මූල්‍ය තත්ත්වයෙහි හා මූල්‍ය ප්‍රතිඵලයෙහි විකෘති තත්ත්වයන් පෙන්නුම් කෙරිණි.

(ඕ) ශ්‍රී ලංකා රජය විසින් ජල සම්පාදන යෝජනා ක්‍රම වෙනුවෙන් ලබාගත් රු.මිලියන 10,455.8 ක විදේශ ණය සඳහා වූ උපණය ගිවිසුම් 11 ක් මහා භාණ්ඩාගාරය සමඟ ඇති කරගෙන නොතිබුණි. මෙහි ප්‍රතිඵලයක් ලෙස ඒවායෙහි ණය හා ප්‍රදානයන්ගේ කොටස විගණනයේදී හඳුනාගත නොහැකි විය. එම නිසා 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු ණය ශේෂය, කල්දැමූ ප්‍රදානයන්, කල්දැමූ ප්‍රදානයන්ට අදාළ ක්‍රමක්ෂය හා පොලී වියදම සහ වගකීම් වල නිවැරදිතාවය හා සම්පූර්ණත්වය පිළිබඳ සහතික කළ නොහැකි විය.

(ක) නැවත අයකල හැකි වැඩ වෙනුවෙන් දරන ලද රු.මිලියන 37.61 ක ලැබිය යුතු කොන්ත්‍රාත් පිරිවැය අදාල ගනුදෙනුකරුගේ අත්තිකාරම් මුදලට හිලව් නොකර අනුචිත ආකාරයට තැන්පත් හා අත්තිකාරම් යටතේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ග) අක්‍රීය වැටුප් හා වේතන ගිණුමේ රු.මිලියන 36.87 ක ශේෂය 2000 වර්ෂයේ සිට මූල්‍ය ප්‍රකාශනවල ඉදිරියට ගෙනවිත් තිබුණි. එසේ වුවත්, 2012 වර්ෂයේදී හෙළිදරව් කරගත් 2001 සහ 2002 වර්ෂ සඳහා ගෙවිය යුතු වැටුප් හා වේතන වලට අදාල රු.මිලියන 8.8 ක වැරදි නිවැරදි කිරීමක් ඉහත දක්වා තිබුණු ගිණුමේ ශේෂයට නිවැරදි නොවන ආකාරයට හිලව් කර තිබුණු නමුත් එය සමාලෝචිත වර්ෂයේදීද නිවැරදි කර නොතිබුණි.

(ජ) නැවත අයකළ හැකි යෝජනා ක්‍රම 61 ක් 2013 දෙසැම්බර් 31 දිනට නිමකර භාරදී තිබුණු නමුත් මෙම යෝජනා ක්‍රම වලට අදාළ රු.මිලියන 28.51 ක නිරවුල් නොකළ ශේෂයන් නැවත අයකල හැකි ගනුදෙනුකරුවන්ගේ අත්තිකාරම් ගිණුමේ තිබුණු බව නිරීක්ෂණය විය.

(ට) ස්පාඤ්ඤ සුනාමි සහන අරමුදල් උපයෝජනය කර ක්‍රියාත්මක කර තිබුණු මොරටුව, පානදුර සහ මීගමුව ප්‍රදේශවල පානීය පිරිපහදු ජල පහසුකම් සැපයීම නිර්මාණය කිරීමේ හා ඉදිකිරීමේ ව්‍යාපෘතිය යටතේ 2009 වර්ෂයේදී ඉදිකළ රු.මිලියන 363 ක් වූ මුහුදු ජලය පිරිපහදු කිරීමේ යන්ත්‍රාගාරයෙහි වටිනාකම 2013 දෙසැම්බර් 31 දිනට වර්ෂ 05 ක් ඉක්මගිය පසුද ප්‍රාග්ධනිත කර නොතිබුණි.

ජල තුළුමුවේ ඇතිවූ ගැටලු හේතුවෙන් ඉහත පහසුකම 2010 ජුලි මාසයේ සිට ක්‍රියාත්මක නොකරන බව තවදුරටත් නිරීක්ෂණය විය. එසේ වුවත් විදුලි ගාස්තු, මෝටර් රථ කුලියට ගැනීම සහ කාර්යාල උපකරණ සඳහා වූ සේවා ගිවිසුම් වෙනුවෙන් 2010 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා රු.මිලියන 14.8 ක් වැයකර තිබුණි.

(ඩ) 2013 දෙසැම්බර් 31 දින දක්වා වර්ෂ 8 කට වැඩි කාලයක සිට වෙනස් නොවී පැවතුණු ව්‍යාපෘති 29 කට අදාල, එකතුව රු.මිලියන 10,358.38 ක විදේශ ප්‍රදාන ශේෂයන් ක්‍රමක්ෂය කර නොතිබුණි. මෙම විදේශ ප්‍රදානයන්ට අදාල වත්කම් පිළිබඳ විස්තර නොමැතිවීම නිසා ක්‍රමක්ෂය නොකිරීමෙන් මූල්‍ය ප්‍රකාශනවලට ඇතිවී ඇති බලපෑම විගණනයේදී ගණනය කළ නොහැකි විය.

(ණ) නිශ්චිතව ව්‍යාපෘති වෙනුවෙන් ප්‍රතිපාදනය කළ නොහැකි, විදේශ ප්‍රදානයන් ලෙස ගිණුම්ගත කර තිබුණු එකතුව රු.මිලියන 2.45 ක ගනුදෙනු 2013 දෙසැම්බර් 31 දිනට ක්‍රමක්ෂය කර නොතිබුණි.

(ත) තිරුක්කෝවිල් හා පොතුවිල් ප්‍රාදේශීය සහායක මධ්‍යස්ථාන වලට යුනිසෙෆ් හා රතු කුරුස සංවිධාන මඟින් පරිත්‍යාග කර ප්‍රධාන කාර්යාලයට මාරුකර තිබුණු එකතුව රු.මිලියන 1,252.66 ක වත්කම් අදාල ප්‍රදානයන් යටතේ ක්‍රමක්ෂය කර ගිණුම්ගත කර නොතිබුණි.

(ද) වෙළඳපොල පොළී අනුපාතයන්ට වඩා අඩු පොලී අනුපාතයන් යටතේ ලබාදී තිබුණු රාජ්‍ය ණය ප්‍රතිලාභ රජයේ ප්‍රදාන ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

මේ සම්බන්ධයෙන් මණ්ඩලයේ සභාපතිවරයා "ප්‍රාග්ධනය සැපයීමේ එකම කොටස්කරු රජය වන අතර සහනාධාර සමඟ ඒකාබද්ධකර ප්‍රදානයන් හා අනෙකුත් ආධාර, ණය යෝජනාක්‍රම සමඟ ලබාදෙනු ලබයි. මෙම නිසා රජය ණය ලබාදෙන කොන්දේසි යටතේ ණය ලබාදෙන වෙනත් තරඟකාරී ආයතන නොමැති බවත් මෙම නිසා රජය මඟින් ලබාදෙනු ලබන වෙළඳපොල පොළී අනුපාත පදනම් කරගත් ණය ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට ලබාගත නොහැකි බවත්" වාර්තා කර තිබුණි.

(න) නියැදි විගණන පරීක්ෂාවට අනුව, විදේශාධාර ව්‍යාපෘති වලට අදාලව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පවත්වාගෙන යනු ලබන අග්‍රිම අරමුදල් ගිණුමේ 2013 දෙසැම්බර් 31 දිනට පැවති එකතුව රු.මිලියන 283.59 ක අග්‍රිම ශේෂය ගිණුම්වලට ඇතුළත් කර නොතිබුණි.

(ප) යාපනය හා කිලිනොච්චි ජල සම්පාදන ව්‍යාපෘතියෙහි සහ රත්මලාන, මොරටුව හා ජා ඇල අපජලය කළමනාකරණ ව්‍යාපෘතියෙහි කෙරීගෙන යන වැඩ වටිනාකම් පිළිවෙලින් රු.මිලියන 389.04 කින් හා රු.මිලියන 22.01 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(බ) පිළිවෙලින් අග්‍රිම අරමුදල් ගිණුම් ශේෂය කෙරීගෙන යන වැඩ ශේෂයට ඇතුළත් කිරීම සහ ගිණුම් තැබීමේදී වැරදි කේත යොදා ගැනීම හේතුවෙන් වියළි කලාපයෙහි නාගරික ජලසම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතියෙහි සහ මහ කොළඹ අපජලය කළමනාකරණ ව්‍යාපෘතියෙහි කෙරී ගෙන යන වැඩ ශේෂ පිළිවෙලින් රු.මිලියන 145.62 කින් හා රු.291,000 කින් වැඩියෙන් දක්වා තිබුණි.

### 2.2.3 නොසැසඳු වෙනස්කම්

---------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු ශේෂයන් හා අනෙකුත් ගෙවිය යුතු ශේෂයන්ට අදාලව මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු අගයන් හා අදාල උපලේඛන අතර පිළිවෙලින් රු.මිලියන 180.42 ක හා රු.593,910 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) කුරුණෑගල ව්‍යාපෘතියෙහි මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණු ණය පොළී ශේෂය සහ මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන අතර රු.886,102 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඇ) මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු විශේෂ ව්‍යාපෘති සඳහා ගෙවා තිබුණු අත්තිකාරම් ශේෂ සහ විගණනයට ඉදිරිපත් කළ වයස් විශ්ලේෂණයේ දක්වා තිබූ ශේෂ අතර රු.මිලියන 1,087.44 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඈ) එක් එක් ණයගැති ශේෂයන් සහ ණයහිමි ශේෂයන් පාලන ගිණුම් සමඟ සැසඳීමේ ක්‍රමවේදයක් නොතිබීම නිසා ණයගැති ගිණුම් 13 කට අදාල එකතුව රු.මිලියන 819.63 ක ණයශේෂ සහ ණයහිමි ගිණුම් 11 කට අදාල එකතුව රු.මිලියන 266.62 ක ණයහිමි ශේෂ නොසසදා තිබුණි. මෙයින් එකතුව රු.මිලියන 50.42 ක බැරශේෂ සහ එකතුව රු.මිලියන 137.81 ක හර ශේෂ වර්ෂ තුනකට වඩා පැරණි ශේෂයන් විය.

(ඉ) අළුතින් හඳුන්වා තිබුණු ඉන්වෙන්ට්‍රි කළමනාකරණ පරිගණක පද්ධතිය මඟින් ප්‍රමාණවත් තොරතුරු ලබාගැනීමට නොහැකි වීම නිසා ප්‍රධාන ගබඩාවේ පිත්තල අයිතම වලට අදාල තොග ලෙජර් ශේෂය සහ පරිගණකගත කළ ඉන්වෙන්ට්‍රි පද්ධතියේ ශේෂයන් අතර රු.මිලියන 16.44 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඊ) මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු එකතුකළ අගය මත නිමවුම් බද්ද (VAT on output) සහ බස්නාහිර ප්‍රාදේශීය සහායක මධ්‍යස්ථානය මඟින් ජලය විකිණීමට අදාලව ලබාදුන් තොරතුරු මත විගණනය විසින් ගණනය කළ අගය අතර රු.මිලියන 3.7 ක වෙනසක් නිරීක්ෂණය විය.

(උ) ප්‍රාදේශීය කාර්යාලවලට අදාළ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු කෙරීගෙන යන වැඩ ශේෂය අදාළ විස්තරාත්මක උපලේඛන සමඟ සසඳා නොතිබීම නිසා රු.මිලියන 4.39 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඌ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු කෙරීගෙන යන වැඩ ශේෂය, විසල් ත්‍රිකුණාමලය ජල සැපයුම් ව්‍යාපෘතියෙහි මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු එක් එක් ශේෂයන් සමඟ සසඳා නොතිබුණු බැවින් මූල්‍ය ප්‍රකාශන දෙක අතර රු.මිලියන 953.22 ක ශුද්ධ වෙනසක් නිරීක්ෂණය විය.

(එ) ගිණුම් පහකට අදාල එකතුව රු.මිලියන 1.83 ක්වූ හඳුනා නොගත් හර ශේෂ සහ ගිණුම් හතකට අදාල එකතුව රු.මිලියන 15.12 ක් වූ හඳුනා නොගත් බැර ශේෂ නිරවුල් කිරීමකින් තොරව සැලකිය යුතු කාලයක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඒ) ත්‍රිකුණාමලය ප්‍රාදේශීය කාර්යාලයේ 2013 දෙසැම්බර් 31 දිනට වූ රැස් කිරීමේ පාලක ගිණුමේ තිබුණු රු.මිලියන 5.11 ක ශේෂය වර්ෂ 3 කට වැඩි කාලයක් නිරවුල් කිරීමකින් තොරව ගිණුම්වල රැඳී තිබුණි.

(ඔ) මණ්ඩලයේ වාණිජ අංශය මගින් විකුණුම් ආදායමට අදාල තොරතුරු නඩත්තු කර තිබුණද, මීටර් විකුණුම්, බවුසර් සැපයුම් (503) තොග සැපයුම් (502) වලට අදාලව වාණිජ අංශය විසින් පවත්වාගෙන ගිය වාර්තාවල සඳහන් අගයන් සහ ඊට අනුරූපීව මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු අගයන් අතර සැලකිය යුතු විචලනයන් එනම් පිළිවෙලින් රු.මිලියන 1,088.2 ක් , රු.මිලියන 4.5 ක් සහ රු.මිලියන 101.8 ක් නිරීක්ෂණය විය.

(ඕ) 2013 දෙසැම්බර් 31 දිනට සැසදිය යුතුව තිබුණු හඳුනා නොගත් සහ නොසැසඳූ නිරවුල් නොකළ හර හා බැර ශේෂ පිළිවෙලින් රු.මිලියන 236.23 ක් හා රු.මිලියන 190.26 ක් විය.

අක්‍රීය ශේෂයන් ලෙස වර්ගීකරණය කර තිබුණු ඉහත සඳහන් හර හා බැර ශේෂ වලට අමතරව, 2013 දෙසැම්බර් 31 දිනට එකතුව රු.මිලියන 57.41 ක් වූ හඳුනා නොගත් ශේෂයන් කීපයක් විය.

### 2.2.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මාර්ග සංවර්ධන අධිකාරිය (RDA) පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය (PRDA) සහ නගර සභාවල තබා තිබුණු රු.මිලියන 33.08 ක කෙටිකාලීන තැන්පතු ශේෂ 1999 වර්ෂයේ සිට අයකර නොගත් ශේෂ ලෙස රැඳී තිබුණි.

(ආ) එවකට පැවති ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශයට 2002 වර්ෂයේදී ලබාදී තිබුණු රු.මිලියන 4.38 ක අත්තිකාරමක් 2015 ජූලි මාසය අවසානය දක්වා නිරවුල් කර නොතිබුණු අතර මණ්ඩලය විසින් මේ සම්බන්ධ කිසිදු පියවරක් ගෙන නොතිබුණි.

(ඇ) 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල අනෙකුත් ලැබිය යුතු ගිණුම් යටතේ දක්වා තිබුණු අනෙකුත් ලැබිය යුතු ණය ශේෂය රු.මිලියන 64 ක් විය. මෙයින් වර්ෂ තුනකට වඩා පැරණි ණය ශේෂය රු.මිලියන 22.33 ක් වූ අතර වර්ෂ 11 කට වඩා පැරණි ණය ශේෂය රු.මිලියන 12.3 ක් විය. ලැබිය යුතු මුළු ණය ශේෂයෙන් කොළඹ මහා නගර සභාවෙන් ලැබිය යුතු ණය ශේෂය රු.මිලියන 54 ක් හෙවත් සියයට 84 ක් නියෝජනය වේ. මෙම ශේෂ අයකර ගැනීම සඳහා ඵලදායී පියවර ගෙන නොතිබුණි.

(ඈ) මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු කොළඹ මහා නගර සභාවෙන් අයවිය යුතු ණය ශේෂය රු.මිලියන 28.52 ක් වූ අතර මෙයින් රු.මිලියන 16.26 ක් වර්ෂ නවයකට වඩා වැඩි කාලයක් පැරණි ශේෂයක් වූ අතර ඉතිරි ණය ශේෂය වර්ෂ තුනකට වඩා පැරණි ණය ශේෂයක් විය. මෙම ණය අයකර ගැනීම සඳහා ඵලදායී ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඉ) 2013 දෙසැම්බර් 31 දිනට වර්ෂ තුනකට වඩා පැරණි රු.මිලියන 9.21 ක මලපවහන ණය ශේෂය අයකර ගැනීමට ඵලදායී ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඊ) 2010 හා 2013 වර්ෂවල හඳුනාගත් කැළණිය හා කෑගල්ල ප්‍රාදේශීය කාර්යාලවල සහ භූගත ජල අංශයෙහි ඇතිවී තිබුණු පිළිවෙලින් රු.මිලියන 2.42 ක්, රු.586,232 ක් සහ රු.මිලියන 1.8 ක් වූ තොග ඌනතාවයන් අදාළ ඌනතාවයන් වලට වගකිව යුතු නිලධාරින්ගෙන් අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි.

(උ) කාර්ය මණ්ඩලයට ලබාදී තිබුණු වර්ෂ 8 කට වඩා පැරණි රු.මිලියන 9.49 ක ණය අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි.

(ඌ) සේවකයින්ට ලබාදී තිබුණු රු.මිලියන 21.27 ක සේවක ණය හා අත්තිකාරම් අයකර ගැනීමට පියවර නොගෙන අක්‍රීය ණය ලෙස වර්ගීකරණය කර තිබුණි.

(එ) මන්නාරම ජල සැපයුම් යෝජනා ක්‍රමයේ කොන්ත්‍රාත්කරුට 2012 වර්ෂයේදී නිකුත් කර තිබුණු වටිනාකම රු.මිලියන 1.40 ක් වූ ජල පොම්ප හා සවි කිරීම් ප්‍රතිෂ්ඨාපනය කර හෝ ආපසු භාරදී නොතිබුණි.

(ඒ) 1997 සිට 2012 කාලපරිච්ඡේදය තුල හා 1999 සිට 2012 කාලපරිච්ඡේදය තුල සැපයුම්කරුවන්ට හා කොන්ත්‍රාත්කරුවන්ට ලබාදී තිබුණු පිළිවෙලින් රු.මිලියන 1.06 ක හා රු.මිලියන 19.3 ක අත්තිකාරම් අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි.

(ඔ) 1995 සිට 2009 දක්වා වූ කාලපරිච්ඡේදය තුල නිලධාරින්ට හා ආයතනවලට මිලට ගැනීම් සඳහා ලබාදී තිබුණු රු.906,013 ක අත්තිකාරම් 2015 ජූලි මාසය අවසානය දක්වාම නිරවුල් කර නොතිබුණි.

(ඕ) ත්‍රිකුණාමලය හා හෝමාගම ප්‍රාදේශීය සහායක මධ්‍යස්ථානවලට අදාළ පිළිවෙලින් රු.මිලියන 30.5 ක හා රු.මිලියන 11.34 ක අක්‍රීය ශේෂ නිරවුල් කිරීමකින් තොරව වර්ෂ 03 කට වැඩි කාලයක් එක්රැස් කිරීමේ පාලන ගිණුමේ රැඳී තිබුණි.

(ක) 2013 දෙසැම්බර් 31 දිනට තිබුණු රු.මිලියන 40.75 ක මාර්ගස්ථ තොග ශේෂය විමර්ශනය කිරීමකින් තොරව වර්ෂ 02 කට වැඩි කාලයක් පැවතුණි.

(ග) නැවත අයකළ හැකි වැඩ තුනකට අදාළව ගනුදෙනුකරුවන්ට ලබාදී තිබුණු එකතුව රු.මිලියන 6.27 ක්වූ අත්තිකාරම් ශේෂ කිසිදු කාර්යයක් ඉටු කිරීමකින් තොරව වර්ෂ 15 කට වැඩි කාලයක් පැවතුණි.

(ජ) බස්නාහිර දකුණ හා බස්නාහිර උතුර ප්‍රාදේශීය සහායක මධ්‍යස්ථානවලට අයත් නැවත අයකළ හැකි ව්‍යාපෘති සඳහා 2010 හා 2012 වර්ෂවල ගනුදෙනුකරුවන්ගෙන් ලැබී තිබුණු පිළිවෙලින් රු.මිලියන 2.81 ක හා රු.මිලියන 1.06 ක අත්තිකාරම් වලින් වැය දරා නොතිබුණි.

(ට) වර්ෂ 02 ක් වැඩි කාලයක් පැවති එකතුව රු.මිලියන 145.18 ක්වූ ලැබිය යුතු අත්තිකාරම් අයකර ගැනීමට සහ එකතුව රු.මිලියන 45.87 ක ගෙවිය යුතු ශේෂයන් නිරවුල් කිරීමට පියවර ගෙන නොතිබුණි.

(ඩ) විශේෂ ව්‍යාපෘති සඳහා ප්‍රදානය කළ වර්ෂ 02 කට වැඩි කාලයක් පරිශේෂව පැවති හා 2004 වර්ෂයේ සිට අයවිය යුතු පිළිවෙලින් රු.මිලියන 8.55 ක හා රු.මිලියන 5.52 ක අත්තිකාරම් අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි.

2.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

-------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ගිණුම් කේත අංක 00/0/20/264/0 සහ 00/0/65/264/0 ට අදාළ පිළිවෙලින් රු.මිලියන 12.68 ක් හා රු.මිලියන 1.35 ක් වූ කෙටිකාලීන ආරක්ෂක තැන්පත් සඳහා විස්තරාත්මක උපලේඛන විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ආ) ප්‍රාදේශීය කාර්යාල 04 කට අදාළ රු.මිලියන 40.27 ක එකතු කළ අගය මත නිමැවුම් බදු (VAT Output) නොගෙවීමට හේතු විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ඇ) කෙරීගෙන යන වැඩ ගිණුමේ පැවති රු.මිලියන 1,007.15 ක ශේෂය දීර්ඝ කාලයක් නොවෙනස්ව රැඳී තිබීමට හේතු විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ඈ) කෙටි කාලයක් තුළ නිම කිරීමේ හැකියාව ඇති නැවත අයකළ හැකි වැඩ බොහෝ අවස්ථාවල වර්ෂයකට අඩු කාලයක් තුළ නිමකළ හැකිය. එසේ වුවත්, 2013 දෙසැම්බර් 31 දින දක්වා වර්ෂ තුනකට වැඩි කාලයක සිට ලබාගත් නැවත අයකළ හැකි කාර්යයන් 30 කට අදාළව පාරිභෝගිකයන්ගෙන් ලබාගත් එකතුව රු.මිලියන 70.82 ක අත්තිකාරම් කිසිදු වෙනස් කිරීමකින් තොරව මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. එසේම 2013 දෙසැම්බර් 31 දින දක්වා වර්ෂ දෙකකට වැඩි කාලයක සිට ලබාගත් නැවත අයකළ හැකි කාර්යයන් 76 කට අදාළව ගනුදෙනුකරුවන්ගෙන් ලබාගත් එකතුව රු.මිලියන 284.65 ක අත්තිකාරම් ද කිසිදු වෙනස්වීමකින් තොරව මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. එක් එක් කාර්යයන්වල ප්‍රගති වාර්තා හා ප්‍රමාද වීමට හේතු යනාදිය විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ඉ) නැවත අයකළ හැකි වැඩවලට අදාළ වටිනාකම රු.මිලියන 69.17 ක් සම්බන්ධයෙන් විස්තරාත්මක උපලේඛන විගණනයට ඉදිරිපත් නොකෙරුණි. එසේම රත්නපුර ප්‍රාදේශීය කාර්යාලයට අයත් නැවත අයකළ හැකි වටිනාකම රු.මිලියන 14.21 ක්වූ ජල යෝජනා ක්‍රම 17 ක සහ ත්‍රිකුණාමලය ප්‍රාදේශීය කාර්යාලයට අයත් වටිනාකම රු.මිලියන 7.58 ක් වූ නැවත අයකළ හැකි ජල යෝජනා ක්‍රම 08 ක විස්තර විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ඊ) ත්‍රිකුණාමල ප්‍රාදේශීය කාර්යාලයේ 2013 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 6.04 ක නැවත අයකළ හැකි වැඩ සඳහා ලැබිය යුතු ශේෂයන් නිරීක්ෂණය විය. මෙම ශේෂයට අදාළ විස්තර විගණනයට ඉදිරිපත් නොකෙරුණු අතර මෙම ශේෂය පිළිබඳ විමර්ශනය කිරීමකින් තොරව වර්ෂයෙන් වර්ෂයට වර්ෂ 03 කට වැඩි කාලයක් ගිණුම්වල ඉදිරියට ගෙනවිත් තිබුණි.

(උ) 2000 සිට 2008 වර්ෂ දක්වා කාලපරිච්ඡේදය තුළ ලබාදී තිබුණු රු.මිලියන 44.34 ක කොන්ත්‍රාත් අත්තිකාරම් වලට අදාළව එම කොන්ත්‍රාත් අවසන් කළ හෝ නොකළ බව තහවුරු කිරීමට අදාළ විස්තර විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ඌ) රු.මිලියන 2.26 ක්වූ වෙළඳ හා අනෙකුත් ණය ශේෂ, රු.මිලියන 135.28 ක්වූ අනෙකුත් ගෙවිය යුතු ශේෂ සහ රු.මිලියන 210,017.62 ක ප්‍රාග්ධන ප්‍රදාන ශේෂ වලට අදාළ විස්තරාත්මක උපලේඛන සහ වයස් විශ්ලේෂණ විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

## 2.3 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීමේ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති, රීති හා රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 2006 සැප්තැම්බර් 22 දිනැති අංක 30 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය | මණ්ඩලයේ බඳවා ගැනීමේ හා උසස් කිරීමේ ක්‍රියාපටිපාටිය සම්බන්ධව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. |
| (ආ) මණ්ඩලයේ ගබඩා කළමනාකරණ මඟ පෙන්වීම | පාලක සභාවේ අනුමැතිය ලබාගැනීමෙන් පසුව මාස 3 ක් ඇතුළත හානි වූ තොග ඉවත් කිරීමට හෝ විනාශ කිරීමට කටයුතු කළ යුතු නමුත්, 2013 දෙසැම්බර් 31 දිනට වටිනාකම රු.මිලියන 19.29 ක්වූ හානිවූ තොග වර්ෂ 2 කට වැඩි කාලයක සිට තොගයෙහි රැඳී තිබුණි. |

## 3. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 3.1 මූල්‍ය සමාලෝචනය

#### 3.1.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව, 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මණ්ඩලයේ වැඩකටයුතු වලින් වූ මූල්‍ය ප්‍රතිඵලය රු.මිලියන 1,050 ක බදු පූර්ව ශුද්ධ ලාභයක් වූ අතර එයට අනුරූපී ඉකුත් වර්ෂයේ බදු පූර්ව ශුද්ධ ලාභය රු.මිලියන 417 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු.මිලියන 633ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි. ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී ජල මීටර් විකුණුම් ආදායම කැපී පෙනෙන ලෙස ඉහළ යාම සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි වර්ධනයට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

### 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

විවිධ අදියරයන්ට අදාළ මූල්‍ය ප්‍රතිඵලවල සාරාංශයක් පහත සඳහන් වගුවෙන් දැක්වේ.

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

| | 2013 | 2012 | වෙනස්වීම | |
|---|---|---|---|---|
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | ප්‍රතිශතය |
| ආදායම | 17,217 | 14,558 | 2,659 | 18.26 |
| විකුණුම් පිරිවැය | (10,157) | (9,036) | (1,121) | 12.41 |
| දළ ලාභය | 7,060 | 5,522 | 1,538 | 27.85 |
| අනෙකුත් මෙහෙයුම් ආදායම් හා ප්‍රතිලාභ | 1,195 | 1,586 | (391) | - 24.65 |
| පරිපාලන වියදම් | (5,831) | (5,838) | 7 | - 0.12 |
| අනෙකුත් මෙහෙයුම් වියදම් | (559) | (54) | (505) | 935.18 |
| මෙහෙයුම් ලාභය (අලාභය) | 1,865 | 1,216 | 649 | 53.37 |

| | | | | |
|---|---|---|---|---|
| මූල්‍ය ආදායම් | 225 | 214 | 11 | 5.14 |
| මූල්‍ය වියදම් | (1,040) | (1,013) | (27) | 2.67 |
| බදු පෙර ලාභය / අලාභය | 1,050 | 417 | 633 | 151.80 |
| බදු | (47) | (40) | (7) | 17.50 |
| වර්ෂයේ ලාභය (අලාභය) | 1,003 | 377 | 626 | 166.04 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ඉකුත් වර්ෂය සමග සැසඳීමේදී ප්‍රවර්ථන වර්ෂයේ දළ ලාභය සියයට 27.85 කින් වර්ධනය වී තිබුණි. අනෙකුත් මෙහෙයුම් වියදම් සියයට 935 කින් වැඩිවීමේ සහ අනෙකුත් මෙහෙයුම් ආදායම් හා ප්‍රතිලාභ සියයට 25 කින් අඩුවීමේ බලපෑම සමනය කිරීමට මෙම වර්ධනය ප්‍රමාණාත්මක ශක්තියක් වී තිබුණි.

(ආ) 2012 වර්ෂයේදී රු.571,087 ක්වූ එක් සේවකයෙකුගේ සහභාගය 2013 වර්ෂයේදී සියයට 24 කින් වර්ධනය වී තිබුණු අතර 2012 වර්ෂයේදී රු.38,941 ක්වූ එක් සේවකයෙකුගේ ශුද්ධ ලාභය 2013 වර්ෂයේදී රු.100,902 කින් එනම් සියයට 159 කින් වර්ධනය වී තිබුණි.

(ඇ) ජල සැපයුම් ව්‍යාපෘති සඳහා ලබාගෙන තිබුණු විදේශ ණය සඳහා වූ පොළිය හේතුකොටගෙන පරිභෝජනය කළ ජල ඒකකයක් වෙනුවෙන් මණ්ඩලයට රු.4.93 ක් වැය කිරීමට සිදුව තිබුණු අතර හුදෙක්ම මෙහි ප්‍රතිඵලයක් ලෙස නිෂ්පාදන ඒකක පිරිවැය ඉහළ ගොස් තිබුණි. ඉකුත් වර්ෂයට එරෙහිව සියයට 2 ක අඩුවීමක් නිරූපනය වුවද එය ජල ඒකකයක සමස්ථ නිෂ්පාදන වියදමෙන් සියයට 11 ක් විය.

## 3.3 මෙහෙයුම් සමාලෝචනය

### 3.3.1 කාර්යසාධනය

**(අ) මූල්‍ය කාර්යසාධනය**

මණ්ඩලය විසින් ජල සම්පාදන යෝජනා ක්‍රම වෙනුවෙන් මහා භාණ්ඩාගාරය හරහා ලබාගෙන තිබුණු සමස්ථ විදේශ ණය ශේෂය 2013 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 36,587 ක් හෙවත් මුළු වත්කම් වලින් සියයට 14.69 ක් විය. පහත විග්‍රහ කර ඇති පරිදි, 2013 දෙසැම්බර් 31 දිනට හිඟහිටි ණය වාරික රු.මිලියන 5,825 ක් වූ අතර, මේ අනුව ප්‍රමාද කාලය වෙනුවෙන් ගෙවා තිබුණු අතිරේක ණය පොලිය රු.මිලියන 280 ක් විය.

| වර්ෂය | හිඟහිටි ණය වාරික | | | නියමිත දිනට ණය පොලිය නොගෙවීම නිසා ගෙවූ අතිරේක පොලිය |
|---|---|---|---|---|
| | මූලික ණය ගෙවීම් | පොලිය | එකතුව | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 2013 | 1,005 | 1,750 | 2,755 | - |
| 2012 | 990 | 682 | 1,672 | 59 |
| 2011 | 957 | - | 957 | 115 |
| 2010 | 441 | - | 441 | 106 |
| එකතුව | 3,393 | 2,432 | 5,825 | 280 |

(ආ) පිරිසිදු ජලය නිෂ්පාදනය හා බෙදාහැරීම

---------------------------------------------

2012 වර්ෂයේ නිෂ්පාදනය කර තිබුණු පිරිසිදු ජලය ඝණ මීටර් මිලියන 526 සමඟ සැසඳීමේදී, සියයට 4.07 ක වර්ධනයක් පෙන්නුම් කරමින් 2013 වර්ෂය තුළදී ඝණ මීටර් මිලියන 547 ක් මණ්ඩලය විසින් නිෂ්පාදනය කර තිබුණි. සමාලෝචිත වර්ෂය අවසානයට ජල සැපයුම් සම්බන්ධතා 120,084 ක් ලබාදී තිබුණු අතර ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සියයට 13.5 ක අඩුවීමක් පෙන්නුම් කෙරුණි.

**(ඇ) ආදායම් නොලබන ජලය (NRW)**

**-------------------------------------**

ආදායම් නොලබන ජලය හේතුවෙන් මණ්ඩලයට වූ අලාභය හඳුනාගෙන වෙනමම ගිණුම්ගත කර නොතිබුණු නමුත් එය සාමාන්‍ය පිරිවැයක් ලෙස ගිණුම්වලට ඇතුළත් කර තිබුණි. සමාලෝචිත වර්ෂයෙහි හා ඉකුත් වර්ෂ හතරෙහි ආදායම් නොලබන ජලය පිළිබඳ විස්තර පහත දැක්වේ.

| විස්තරය | 2013 | 2012 | 2011 | 2010 | 2009 |
|---|---|---|---|---|---|
| ----------- | ------- | ------- | -------- | ------ | ------- |
| ජල නිෂ්පාදනය (ඝණ මීටර්) | 547.0 | 525.6 | 490.0 | 469.0 | 449.0 |
| ජල පරිභෝජනය (ඝණ මීටර්) | 381.6 | 368.5 | 344.5 | 321.5 | 309.2 |
| ආදායම් නොලැබූ ජලය (ඝණ මීටර්) | 165.4 | 157.1 | 145.5 | 147.5 | 139.8 |
| නිෂ්පාදිත ජලයෙහි ප්‍රතිශතයක් ලෙස ආදායම් නොලැබූ ජලය | 30.24 | 29.89 | 24.64 | 31.45 | 31.14 |

මේ සම්බන්ධව පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) ජල කාන්දුවීම්, නීත්‍යානුකූල නොවන ජල සැපයුම් සම්බන්ධතා, නොමිලේ සැපයුම් සහ පරිපාලනමය යනාදි කරුණු හේතු කොටගෙන 2013 වර්ෂය තුළදී මණ්ඩලය විසින් නිෂ්පානදය කර තිබුණු ජල ප්‍රමාණයෙන් ආදායම් නොලබන ජලය සියයට 30.24 ක් නියෝජනය කෙරුණි. 2013 වර්ෂයේදී කොළඹ නගරය තුළ ආදායම් නොලබන ජලයෙහි කොටස සියයට 47.71 ක් විය. මෙම තත්ත්වය පාලනය කිරීමට අපොහොසත් වීම නිසා 2013 වර්ෂය තුළ පාරිභෝජනය කළ ජල ඒකකයක් වෙනුවෙන් රු.7.15 ක අමතර පිරිවැයක් දැරීමට මණ්ඩලයට සිදුවී තිබුණු බව නිරීක්ෂණය විය. මෙම ප්‍රමාණය ඒකකයක නිෂ්පාදන පිරිවැයෙන් සියයට 43 ක් නියෝජනය වේ.

(ii) නීත්‍යානුකූල නොවන ජල සම්බන්ධතා අවම කිරීමටත්, ජල සැපයුම් නලවල තාවකාලික බිඳවැටීම් කඩිනමින් අළුත්වැඩියා කිරීමටත්, මණ්ඩලය විසින් පසුගිය කාල පරිච්ඡේදය තුළ ඇතැම් ක්‍රියාමාර්ග මාලාවක් ගෙන තිබුණ ද 2011 වර්ෂය සමඟ සැසඳීමේදී ප්‍රවර්ථන වර්ෂයේ ආදායම් නොලබන ජල ප්‍රමාණයෙහි අනුපාතය සියයට 5.6 කින් ඉහළ ගොස් තිබුණි.

(iii) වර්ෂ 75 කට වඩා පැරණි කොළඹ නගරයේ ප්‍රධාන ජල බෙදාහැරීමේ පද්ධතිය නවීකරණය කිරීමේ අවශ්‍යතාවය නිසා මෙම කාර්යය සැලසුම් කර ක්‍රියාත්මක කිරීම පිණිස මණ්ඩලයේ විශේෂ අවධානය යොමු කළ යුතු වේ. වර්තමානයේ විදේශාධාර ව්‍යාපෘති 2 ක් මේ සම්බන්ධයෙන් ක්‍රියාත්මක වෙමින් පැවතියද ප්‍රධාන ජල සැපයුම් පද්ධතියේ ප්‍රමාණවත් ලෙස නැවත ගොඩනැංවීමේ අරමුණු ලඟාකරගෙන නොතිබුණි. ජලය කාන්දු වීම නිසා නැවත ප්‍රතිෂ්ඨාපනය කළ යුතු ජලය බෙදාහැරීමේ මාර්ග මේ වන විටත් හඳුනාගෙන නොතිබුණි. ප්‍රධාන ව්‍යාපෘති යෝජනා කිහිපයක් ක්‍රියාත්මක කිරීම සඳහා යෝජනා කර තිබුණද ඒවා ක්‍රියාත්මක වීම ඉතා සෙමින් සිදුවී තිබුණි.

(iv) කොළඹ නගර සීමාව හැර අනෙකුත් ප්‍රදේශවල ආදායම් නොලබන ජලය අඩුකිරීම සඳහා මණ්ඩලයේ අවධානය ප්‍රමාණවත් ලෙස යොමුවී නොතිබුණු අතර, සංයුක්ත සැලැස්මේ මේ සම්බන්ධව දක්වා තිබුණු ඉලක්කයන් තාත්වික නොවන බව නිරීක්ෂණය විය.

**(ඇ) මලාපවහන පද්ධතිය**

රටේ ආර්ථික සංවර්ධනයත් සමඟම ඇතිවූ නාගරීකරණය නිසා නගරවල මලාපවහන බැහැර කිරීමේ යටිතල පහසුකම් ඉහළ නැංවීමේ අවශ්‍යතාවය පැනනැගී තිබුණු අතර මෙම පහසුකම් සැපයීම මණ්ඩලයේ වගකීම වුවද මෙම අංශයෙහි සැලකිය යුතු ප්‍රගතියක් මෑත වර්ෂ කිහිපය තුළ පෙන්නුම් නොකෙරුණි. මලාපවහන බැහැර කිරීමේ පහසුකම් ජනගහණයෙන් සියයට 7 කට සැපයීමට ජාතික ප්‍රතිපත්තියක් ලෙස අපේක්ෂා කර තිබුණද, මෙම ඉලක්කය ලඟා කර ගැනීම පිළිබඳ පරීක්ෂා කිරීමට අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණි. මණ්ඩලයේ සභාපතිවරයා මේ සම්බන්ධව පහත සඳහන් පරිදි අදහස් දක්වා තිබුණි.

"රටේ ජනගහණයෙන් සියයට 7 කට ජාතික ප්‍රතිපත්තියක් ලෙස මලාපවහන පහසුකම් සැපයීමට අපේක්ෂා කළද, මෙම ව්‍යාපෘතිය සඳහා අනුග්‍රාහකයන් හඳුනා නොගැනීම නිසා අප ජලය බැහැර කිරීමේ යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම සීමිත වීම හේතුවෙන් මෙම ඉලක්ක ලඟා කර ගැනීමට නොහැකි විය."

(ඉ) විදේශාධාර ව්‍යාපෘති

මණ්ඩලය විසින් ජල සම්පාදන හා සනීපාරක්ෂක සේවා සැපයීමේ ව්‍යාපෘති ගණනාවක් දේශීය හා විදේශීය අරමුදල් යොදවා ක්‍රියාත්මක කරන අතර මේ සම්බන්ධයෙන් පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

(i) මහා පරිමාණ විදේශාධාර ව්‍යාපෘති බොහොමයක් නියමිත දිනට අවසන් කර නොතිබුණු අතර ව්‍යාපෘති කාලය දීර්ඝ කිරීමේ ප්‍රතිඵලයක් ලෙස අතිරේක වැඩ හා මිල ගණන් ඉහළ යාම නිසා ව්‍යාපෘති පිරිවැය ඉහළ අගයකින් වැඩි තිබුණි.

(ii) ව්‍යාපෘති වල මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හා ඉදිරිපත් කිරීමට ඒකාකාර ගිණුම් ප්‍රතිපත්ති අනුගමනය කර නොතිබුණි.

**3.4 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

(අ) අය කළ හැකි වැඩ සම්බන්ධව මණ්ඩලය නිකුත් කර තිබුණු චක්‍රලේඛයට අනුව, නැවත අයකළ හැකි වැඩවල ලාභ ප්‍රතිශතය සියයට 10 ත් සියයට 25 ත් අතර විය යුතුය. එසේ වුවත්, පහත සඳහන් ව්‍යාපෘති අසාමාන්‍ය ලාභයක් වාර්තා කර තිබුණි.

| ව්‍යාපෘතිය | මුළු ලැබීම් | කළ වැඩ පිරිවැය | ලාභය | ලාභය මුළු ලැබීම් වල ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | |
| 00/0/EC/392/0 | 4,350,360 | 1,319,360 | 3,031,000 | 70 |
| 00/0/EE/392/0 | 6,703,243 | 1,608,018 | 5,095,225 | 76 |

(ආ) 1999 වර්ෂයේදී ලබාදී තිබුණු රු.මිලියන 12.96 ක විශේෂ ප්‍රසාද දීමනාව සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන නොතිබු අතර පසුව මෙම මුදල ලැබිය යුතු මුදලක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. එම නිසා මෙය කාර්යමණ්ඩලය වෙත පොලී රහිතව ලබාදුන් ණය මුදලක් ලෙස සැලකිය හැකිය.

(ඇ) මහා භාණ්ඩාගාරයේ අනුමැතියකින් තොරව , ව්‍යාපෘති කාර්ය මණ්ඩල වල මාසික වැටුපෙන් සහ මණ්ඩලයේ ව්‍යාපෘති වෙනුවෙන් දරන ලද වියදම් වලින් සියයට 20 ක් පොදුකාර්ය වියදම් ලෙස මණ්ඩලය අයකර තිබුණි. සමාලෝචිත වර්ෂය තුළදී වාර්තා කර තිබුණු මුළු පොදුකාර්ය වියදම් වල එකතුව රු.මිලියන 234.01 ක් විය.

(ඇ) විසල් ගාල්ල ජල සම්පාදන ව්‍යාපෘතිය මගින් රු.මිලියන 16 ක් වැයකර හපුගල ජලපිරිපහදු යන්ත්‍රාගාරයක් ඉදිකිරීම සඳහා 2002 වර්ෂයේදී ඉඩමක් අත්පත් කරගෙන තිබුණද, මෙම ඉඩමෙහි විශාල කළුගලක් තිබීම හේතුවෙන් මේ දක්වා මෙම ඉඩම අරමුණු ගත කාර්ය සඳහා යොදවා නොතිබුණි.

(ඉ) ජපාන ජාත්‍යන්තර සහයෝගීතා බැංකුව මගින් අරමුදල් සපයන ලද ආදායම් නොලබන ජල ව්‍යාපෘතිය (SLP – 66) සාර්ථක නොවුණු අතර එහි ප්‍රතිඵලයක් ලෙස පසුව මෙම ව්‍යාපෘතිය අවලංගු කරන ලදි. එසේවුවත්, මේ සඳහා ඒකාබද්ධ අරමුදලින් රු.මිලියන 354.7 ක් වැයකර තිබුණි. මේ සම්බන්ධව පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) වැඩබිම් සැකසීම, සේවක වැටුප් සහ ආයතනික වියදම් සඳහා ඒකාබද්ධ අරමුදලින් සහ ණය මුදලින් රු.මිලියන 171.6 ක් වැයකර තිබුණු අතර එය මණ්ඩලයේ අලාභයක් ලෙස නොසලකා කෙරීගෙන යන වැඩ වටිනාකමට ඇතුලත් කර තිබුණි.

(ii) ඉහත ව්‍යාපෘතියෙන් දරා තිබුණු රු.මිලියන 172 ක උපදේශක සේවා පිරිවැය මහ කොළඹ පුනරුත්ථාපන ව්‍යාපෘතියට මාරුකර තිබුණි. නමුත් මහ කොළඹ පුනරුත්ථාපන ව්‍යාපෘතියෙහි උපදේශක සේවා සඳහා වූ මූලික ඇස්තමේන්තුවෙන් මෙම පිරිවැය අඩුකර නොතිබුණි. මෙම නිසා මෙම පිරිවැයද මණ්ඩලයට අලාභයක් වේදැයි සැකසහිත විය.

මේ සම්බන්ධව මණ්ඩලයේ සභාපතිවරයා විසින් "මහ කොළඹ පුනරුත්ථාපන ව්‍යාපෘතියට උපයෝජනය කරන ලද රු. මිලියන 172 ක උපදේශක ගාස්තු එම ව්‍යාපෘතියෙහි කෙරීගෙන යන වැඩ යටතේ දැක්වෙන බව" දන්වා තිබුණි.

(iii) ව්‍යාපෘතිය මඟින් රු.මිලියන 7 කට මිලට ගෙන තිබුණු ගෑස් අනාවරනය වත්කමක් ලෙස හඳුනාගෙන නොතිබුණි.

(iv) ඉහත ව්‍යාපෘතිය මඟින් රන්දිය ව්‍යාපෘතිය සඳහා යොදවා තිබුණු රු.මිලියන 4 ක කෙරීගෙන යන වැඩ පිළිබඳ සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි.
මේ සම්බන්ධයෙන් මණ්ඩලයේ සභාපතිවරයා විසින් "රු.මිලියන 4 ක ඉතිරිය රන්දිය ව්‍යාපෘතිය සඳහා යොදාගත් අතර එය රන්දිය ව්‍යාපෘතියේ කෙරීගෙන යන වැඩ වලට ඇතුලත් කර ඇත" යනුවෙන් දක්වා තිබුණි.

**3.5 කළමනාකරණ අකාර්යක්ෂමතා**

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ස්වීඩන ජාත්‍යන්තර සංවර්ධන සහයෝගීතා නියෝජිතායනය (SIDA) මඟින් අරමුදල් සපයන ලද මොරටුව/ රත්මලාන සහ ජා ඇල /ඒකල අප ජලය බැහැර කිරීමේ ව්‍යාපෘතියට අදාලව 2008

වර්ෂයේදී ප්‍රදානය කර තිබුණු අංක SP/SIDA/RM/JE/WW/1 කොන්ත්‍රාත්තුව 2013 වර්ෂයේදී කොන්ත්‍රාත්කරු බුන්වත්වීම නිසා අවසන් කර තිබුණි.

ඉහත කොන්ත්‍රාත්තුවට අදාලව විදේශ බැංකුවක් මඟින් ලබාදී තිබුණු කාර්යසාධන බැඳුම්කරය සහ ඇප බැඳුම්කරය කොන්ත්‍රාත්තුව පිළිගත් අවස්ථාවේදී දේශීය බැංකුවක් මඟින් සනාථ කර ගැනීම සඳහා ව්‍යාපෘතිය 2006 ප්‍රසම්පාදන අත්පොතේ ප්‍රතිපාදන වලට අනුකූලවී නොතිබුණි. මෙහි ප්‍රතිඵලයක් ලෙස කොන්ත්‍රාත්කරු ඉදිරිපත් කර තිබුණු එ.ජ.ඩො 9,065,048 ක කාර්ය සාධන බැඳුම්කරය හා එ.ජ.ඩො 7,957,086 ක් වූ රඳවා ගැනීමේ බැඳුම්කරය මුදල් කර ගැනීමට අපොහොසත් වී තිබුණි. ඉහත අපොහොසත්වීම් හේතුවෙන් ව්‍යාපෘතිය දේශීය නීති ක්‍රියාවන්ට එලඹීමට උත්සාහ කර නොතිබූ අතර විදේශීය නීති ක්‍රියාවන්ට එළඹ තිබූ බවටද සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි. ඉහත දෝෂයන්ට අමතරව, මෙම කොන්ත්‍රාත්තුවෙන් මණ්ඩලයට සිදුවී තිබුණු අලාභය ගණනය කර නොතිබුණු අතර, 2015 ජුලි මාසය අවසානය දක්වාම එහි වගකීම නිශ්චය කරද නොතිබුණි.

(ආ) දඹුල්ල ජල පවිත්‍රාගාර මධ්‍යස්ථානයෙහි සවිකර තිබුණු වටිනාකම රු.මිලියන 2.13 ක් වූ වතුර පොම්ප, ඒවා සවිකර වර්ෂ 2 මාස 6 ක කාලයක් ගතවී තිබුණද භාවිතයට ගැනීමට පියවර ගෙන නොතිබුණි.

## 3.6 වත්කම් කළමනාකරණය

----------------------------

**වෙනත් රාජ්‍ය ආයතනවලට මුදාහැර තිබුණු සම්පත්**

--------------------------------------------------

2003 ජුනි 02 දිනැති හා අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.3.9 පරිච්ඡේදයේ සඳහන් නියමයන්ට පටහැනිව මණ්ඩලයට අයත් මෝටර් රථ 56 ක් රේඛීය අමාත්‍යාංශයට සහ පළාත් පාලන ආයතන වලට නිදහස්කර තිබුණු අතර මෙම වාහනවල බලපත්‍ර අළුත් කිරීම හා රක්ෂණය සඳහා සමාලෝචිත වර්ෂය තුළදී මණ්ඩලය මඟින් රු.මිලියන 1.48 ක් වැයකර තිබුණි.

## 4. අයවැය පාලනය

-------------------

සමාලෝචිත වර්ෂය සඳහා වූ අයවැයගත හා තථ්‍ය වියදම් හා ආදායම් අතර සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වුයෙන් අයවැය ලේඛනය ඵලදායී මූල්‍ය කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබුණු බව නිරීක්ෂණය කෙරුණි.

## 5. පද්ධති හා පාලනයන්

---------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දුර්වලතා වරින් වර මණ්ඩලයයේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරවන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් පිළිබඳ විශේෂ අවධානයක් යොමුකළ යුතු වේ.

(අ) පාලන ගිණුම් සැසඳීම
(ආ) තොග පාලනය
(ඇ) ජ'නල් සටහන්
(ඈ) ව්‍යාපෘති පරිපාලනය හා කාර්යසාධනය
(ඉ) ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්